*සැ. යු.-* 2021.10.01 දින පළ වූ අංක 2,248 දරන *ගැසට් පත්‍රයේ* I:III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,249 - 2021 ඔක්තෝබර් මස 08 වැනි සිකුරාදා - 2021.10.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1420 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1429 |


*සැ. යු.-* (i) පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීම පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සමාධි සෞඛ්‍ය සේවා පාරිසරික, කෘෂිකාර්මික, සංස්කෘතික හා ක්‍රීඩා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ඔක්තෝබර් මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ඔක්තෝබර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1419- B 82276 — 5,403 (2021/09)

# පළාත් පාලන නිවේදන

## අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG/LG-5/5/1/19-2 අංක දරන 2021.03.16 දිනැති ලිපිය අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග අරණායක ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සලකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පර්ශවයක් වේ නම් මෙම දැන්වීම පළ කල දින සිට මාස තුනක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ඒ. නිහාල් සෙනවිරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2021 අගෝස්තු මස 19 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | සැලව වාඩියගොඩ මැද පාර |
| මාර්ගයේ ආරම්භය | : | සැලව රන්දිලිගම මාර්ගය |
| මාර්ගයේ අවසානය | : | කේ. සුමනසේන මහතා හිමිකම් කියන කහටකුඹුරලැවත්ත ඉඩම |
| ග්‍රාම නිලධාරි වසම | : | 41ඒ, සැලව නැගෙනහිර |
| මාර්ගයේ දිග හා පළල | : | දිග මීටර් 213 පළල - අඩි 08 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම්*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | ඩී. කපිල රූපසිංහ මයා | රතුපහවත්ත |
| 2. | ඩී. මංජුල හරංකහව මයා | රතුපහවත්ත |
| 3. | ඩී. චන්න ජනකලාල් බණ්ඩාර මයා | රතුපහවත්ත |
| 4. | ඩී. කස්තුරි බණ්ඩාර මයා | රතුපහවත්ත |
| 5. | ඩී. නන්දසේන මයා | රතුපහවත්ත |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම්

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 6. | ඩී. කපිල රූපසිංහ මයා | රතුපහවත්ත |
| 7. | ඩී. චන්න ජනකලාල් බණ්ඩාර මයා | රතුපහවත්ත |
| 8. | ඩී. ඒ. කේ. බණ්ඩාර මයා | රතුපහවත්ත |
| 9. | එච්. සෝමාවතී මිය | වෙලේගෙවත්ත |
| 10. | ඩී. එම්. පී. ආර්. හරංකහව මයා | වෙලේගෙවත්ත |


බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2021.04.03 දින මනින ලද පිඹුරුපත් අංක 872/2021 දරන පිඹුරුපත අනුව වේ.

එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලමිතිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.

පිඹුරු අංකය: 863/2021

## සැලව වාඩියගොඩ මැද පාර

පරිමාණය 1:1000




සත්‍ය පිටපතක් බව සහතික ...

(අත්සන)

ලේකම්
අරණායක ප්‍රාදේශීය සභා

## සබරගමුව පළාතේ

## කෑගල්ල දිස්ත්‍රික්කයේ

ගල්බඩ කෝරළේ තුන්පළාත පත්තුවේ

සැලව නැගෙනිර ගමේ පිහිටි පල්ලේවත්ත, හිටිනාවත්ත, ජේරගස්තැන්න සහ කහටකුඹුරලෑවත්ත යන ඉඩම් හරහා පවතින මාර්ගය මැන සාදන ලද

-පිඹුර-

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) |
|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | |
| 1 | 0.0625 | .00 | 0 | 24.71 | 213.00 | 08 |

(අත්සන) 2021-04-09

මනින ලද්දේ : 2021.03.21 වන දින

එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවිකොමසාරිස් සහ තක්සේරුකරු
අංක 86/04, ජයනිම මාවත
උඩගම, රඹුක්කන.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | රතුපහ තලගහ අසල සිට ගොම්මනවෙල ගලහගම මාර්ගයේ කතරගම දේවාලය දක්වා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | දීවෙල මාවනැල්ල මාර්ගය |
| මාර්ගයේ අවසානය | : | ගලහගම සිය උඩගම බෝධිරාජ පන්සල දක්වා මාර්ගය |
| ග්‍රාම නිලධාරි වසම | : | 16 වාකිරිගල |
| මාර්ගයේ දිග හා පළල | : | දිග මීටර් 284 පළල - අඩි අවම 08 |


*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම්*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| 1. ඩී. කපිල රූපසිංහ මයා | රතුපහවත්ත |
| 2. ඩී. මංජුල හරංකහව මයා | රතුපහවත්ත |
| 3. ඩී. චන්න ජනකලාල් බණ්ඩාර මයා | රතුපහවත්ත |
| 4. ඩී. කස්තුරි බණ්ඩාර මයා | රතුපහවත්ත |
| 5. ඩී. නන්දසේන මයා | රතුපහවත්ත |

මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම් පස ඉඩම් හිමියන්ගේ නම්

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| 6. ඩී. කපිල රූපසිංහ මයා | රතුපහවත්ත |
| 7. ඩී. චන්න ජනකලාල් බණ්ඩාර මයා | රතුපහවත්ත |
| 8. ඩී. ඒ. කේ. බණ්ඩාර මයා | රතුපහවත්ත |
| 9. එච්. සෝමාවතී මිය | වෙලේගෙවත්ත |
| 10. ඩී. එම්. පී. ආර්. හරංකහව මයා | වෙලේගෙවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2021.04.03 දින මනින ලද පිඹුරුපත් අංක 872/2021 දරන පිඹුරුපත අනුව වේ.




| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) |
|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර | | |
| 1 | 0.0876 | 0 | 0 | 34.63 | 284.0 | අවම 08 |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | දම්පැල්ගොඩ එරබදුපිටිය සිට කලුගමුවාපිටිය දක්වා මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | අලපලාවල සිට දම්පැල්ගොඩ දක්වා මාර්ගය |
| මාර්ගයේ අවසානය | : | එම්. පී. ඥාණරත්න මහතා හිමිකම් කියන කලුගමුවාපිටියේහේන ඉඩම |
| ග්‍රාම නිලධාරි වසම | : | 48බී දම්පැල්ගොඩ |
| මාර්ගයේ දිග හා පළල | : | දිග මීටර් 304 පළල - අඩි 08 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම්*

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | එම්. පී. ජයවර්ධන මයා | සියඹලාවත්තේහේන |
| 2. | එම්. ප්‍රේමකුමාර කරුණාරත්න මයා | සියඹලාවත්තේහේන |
| 3. | එස්. ආර්. අජිත් සඳරුවන් සමරකෝන් මයා | සියඹලාවත්තේහේන |
| 4. | එම්. පී. ඉන්දික දමිත් මොල්ලිගොඩ මයා | කලුගමුවාපිටියේහේන |

මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම් පස ඉඩම් හිමියන්ගේ නම්

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | කේ. උපාලි ජයලත් මයා | සියඹලාවත්තේහේන |
| 2. | එම්. පී. සුනෙත්‍රා කාන්ති මිය | සියඹලාවත්තේහේන |
| 3. | එම්. පී. ඉන්දික දමිත් මොල්ලිගොඩ මයා | කලුගමුවාපිටියේහේන |
| 4. | ධර්මසේන මයා | කලුගමුවාපිටියේහේන |
| 5. | එම්. පී. ඉන්දික දමිත් මොල්ලිගොඩ මයා | කලුගමුවාපිටියේහේන |


බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2020.10.04 දින මනින ලද පිඹුරුපත් අංක 772/2020 දරන පිඹුරුපත අනුව වේ.

එච්.එම්.ආර්.පී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තැනීම්කරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පිංනවල, රඹුක්කන.

පිඹුරු අංකය: 772/2020

## දම්පැල්ගොඩ එරබදුපිටිය සිට කළුගමුවාපිටිය දක්වා මාර්ගය

පරිමාණය 1:1000



සබරගමුව පළාතේ

කෑගල්ල දිස්ත්‍රික්කයේ

පරණකුරු කෝරළේ, මාවත පත්තුව දකුණ, දම්පැල්ගොඩ ගමේ පිහිටි සියඹලාපත්තේවත්ත, සහ කළුගමුවාපිටියේවත්ත යන ඉඩම් හරහා පවතින මාර්ගය මැන සාදන ලද

-පිඹුර-

| ඉඩම් අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) |
|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | |
| 1 | 0.1044 | 0 | 1 | 01.28 | 304.00 | 08 |

මනින ලද්දේ : 2020.10.04 වන දින

ඉඩම් පෙන්වා දුන් අය / ඉඩම් බලා ගත් අය } ඉඩම් හිමිකරුවන්

සත්‍ය පිටපතක් බව සහතික කරමි

ලේකම්
අරණායක ප්‍රාදේශීය සභාව

2020-12-01

එච්.එම්.ආර්.පී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තැනීම්කරු
උසාවිකොමසාරිස් සහ තක්සේරුකරු
අංක 86/04, ජයසිරි මාවත
[illegible], රඹුක්කන.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | පොල්අඹේගොඩවත්ත පාර අතුරු මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | පොල්අඹේගොඩවත්ත මාර්ගය |
| මාර්ගයේ අවසානය | : | ජී. සුසන්ත කුමාර මයා හිමිකම් කියන පොල්අඹේගොඩවත්ත ඉඩම |
| ග්‍රාම නිලධාරී වසම | : | 46 ඒ ගොඩිගමුව |
| මාර්ගයේ දිග හා පළල | : | දිග මීටර් 89 පළල - අඩි 08 |

*මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම්*

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| 1. යූ. ආර්. සී. එස්. කුමාර මයා | පොල්අඹේගොඩවත්ත |
| 2. ජේ. කේ. ජයමංගල මයා | පොල්අඹේගොඩවත්ත |
| 3. බී. ජී. මාලනී මිය | පොල්අඹේගොඩවත්ත |

මාර්ග ආරම්භයේ සිට අවසානය දක්වා වම් පස ඉඩම් හිමියන්ගේ නම්

| *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|
| 1. එච්. එම්. යූ. ලසන්තතිලක මයා | පොල්අඹේගොඩවත්ත (මෙම ඉඩමේ මායිම පමණක් ගෙන ඇත) |
| 2. යූ. සුමනසේන මයා | පොල්අඹේගොඩවත්ත |
| 3. ඩබ්ලිව් ගුණරත්න මයා | පොල්අඹේගොඩවත්ත |


බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2020.11.29 වැනි දින මනින ලද පිඹුරුපත් අංක 773/2020 දරන පිඹුරුපත අනුව වේ.

එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලමිතිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.

පිඹුරු අංකය: 773/2020

# පොල්අඹේගොඩවත්ත පාර අතුරු මාර්ගය

පරිමාණය 1:500




සබරගමුව පළාතේ

කෑගල්ල දිස්ත්‍රික්කයේ

ගල්බඩ කෝරළේ තුන්පළාත පත්තුවේ
ගොඩිගමුව ගමේ පිහිටි පොල්අඹේගොඩවත්ත
යන ඉඩම් හරහා පවතින මාර්ගය මැන සදන ලද

-පිඹුර-

සත්‍ය පිටපතක් බව ...

ලේකම්
අරණායක ප්‍රාදේශීය සභාව

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | | |
| 1 | 0.0278 | 0 | 0 | 11.00 | 89.00 | 8 | මාර්ගයේ පවතින පළල ගෙන ඇත. |

2020-12-01

මනින ලද්දේ : 2020.11.29 වන දින

එච්.එම්.ආර්.ටී.කේ. හේරත
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවිකොමසාරිස් සහ තක්සේරුකරු
අංක 86/04, ජයබිම මාවත
දලුග්ගල, රඹුක්කන.

## හලාවත නගර සභාව

### 2022 වර්ෂයේ අයවැය කෙටුම්පත

හලාවත නගර සභාවේ 2022 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය 2021 ඔක්තෝබර් මස 05 වැනි දින සිට 2021 ඔක්තෝබර් මස 13 වැනි දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදු දින හැර) කාර්යාල වේලාව තුළ හලාවත නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව නගර සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීතිවල 10.2 (ආ) රීතිය ප්‍රකාර මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩබ්. එම්. ඒ. තුෂාන් චතුරංග,
සභාපති,
හලාවත නගර සභාව.

2021 ඔක්තෝබර් මස 04 වැනි දින,
හලාවත නගර සභා කාර්යාලය,
හලාවත.

10-119

---

## හපුතලේ නගර සභාව

### 2022 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂාකර බැලීම සඳහා අවස්ථාව සැලසීම

255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 178 වගන්තියෙන් නියම කර ඇති පරිදි හා එම පනතේ 193 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ගරු ඌව පළාත් ආණ්ඩුකාරතුමා විසින් සාදන ලද රීති අනුව මා විසින් හපුතලේ නගර සභාවට අදාළව 2022 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද අයවැය ලේඛනයේ කෙටුම්පත 2021.10.01 වැනි දින සිට හපුතලේ නගර සභා කාර්යාලයේ දී මහජනතාවට පරීක්ෂාකර බැලීම සඳහා අවස්ථාව සලසා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

උපුල් දිසානායක,
සභාපති,
නගර සභාව - හපුතලේ.

2021 සැප්තැම්බර් මස 29 වැනි දින.

10-124

---

## දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බව දැනුම් දීමයි

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාළව කෙටුම්පත් අයවැය ලේඛනය මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී හා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයේ තබා ඇති බව මෙයින් දැනුම් දෙමි.

සුදත් දේශප්‍රිය ජාතුංආරච්චි,
සභාපති,
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව.

10-168

# විවිධ දැන්වීම්

## හපුතලේ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2022 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

බී. කන්දසාමි,<br>
සභාපති,<br>
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,<br>
හපුතලේ ප්‍රාදේශීය සභාව,<br>
දියතලාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134 වගන්තියේ (1) වන උප වගන්තියෙන් හා 146 වන (1) වන උප වගන්තියෙන් හපුතලේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත දියුණු කළ ප්‍රදේශ ලෙස පිහිටියා වූ ප්‍රකාශයට පත්කර ඇති සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල 2018 වර්ෂයට පිළිගෙන ක්‍රියාත්මක කරන ලද 2017 වර්ෂයේ සිදු කළ තක්සේරුව 2022 වර්ෂයටත් පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛනයේ සඳහන් සෑම නිශ්චල දේපළක් යටතේ ගැනෙන නිවසක් සඳහා වාර්ෂික වටිනාකමකින් 3%ක්ද, ව්‍යාපාරික හා වාණිජ ස්ථාන සඳහා වාර්ෂික වටිනාකමින් සියයට 4%ක වරිපනමක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනත 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

01. දියතලාව ප්‍රධාන මාර්ගය, හපුතලේ, බණ්ඩාරවෙල, දියතලාව නගරය හරහා ප්‍රධාන මාර්ගයේ දුම්රිය හරස් පාර, ජලපවිත්‍රාගාර මායිමේ සිට කඩ වීදිය ආමි ඇන්ඩ් නේවි ස්ටෝර්ස් අසල ලී බඩු වෙළඳ සැල දක්වා කොටස, දියතලාව නගරය, උමංකඳුර ග්‍රාම සේවා නිලධාරි වසම්වල කොටස් දෙකක් අයත්ය. මාර්ගය මධ්‍යයේ සිට දෙපස මීටර් 150ක හා මීටර් 300ක් පළල බිම් තීරුවකි.

බණ්ඩාරවෙල පාර - (වම්පස) වරිපනම් අංක 3-65/5<br>
බණ්ඩාරවෙල පාර - (දකුණුපස) වරිපනම් අංක 2-236/2<br>
හපුතලේ පාර - (වම්පස) වරිපනම් අංක 1- 197<br>
හපුතලේ පාර - (දකුණු පස) වරිපනම් අංක 2-162

02. දියතලාව නගරයේ ලංකා විදුලිබල මණ්ඩල කාර්යාලය, රෝහල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉඩම් ඇතුළු වන පරිදි, දුම්රිය පළ පටුමග පාරේ වම් පැත්තට මාර්ගය මධ්‍යයේ සිට මීටර් 100ක මායිමේ සිට ඩවුන් පැට්නා හන්දිය දක්වාත්, පොළ පාර දෙපසට මාර්ගය මධ්‍යයේ සිට මීටර් 150ක් ද, භූමිය අයත් වන පරිදි උමංකඳුර ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයෙන් කොටසක් අයත් වේ.

යහලබැද්ද පාර - (වම්පස) වරිපනම් අංක 45-201
යහලබැද්ද පාර - (දකුණුපස ) වරිපනම් අංක 14-38
ඩවුන්පැට්නා පාර - (වම්පස) වරිපනම් අංක 51-53 2/1
ඩවුන්පැට්නා පාර - (දකුණු පස) වරිපනම් අංක 10/2 - 24/1

03. දියතලාව ප්‍රධාන මාර්ගයේ සිට දොඩම්වත්ත පාරේ ගොවිජන කේන්ද්‍රය දක්වා මාර්ගය මධ්‍යයේ සිට දෙපසට මීටර් 100කි. දොඩම්වත්ත ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ කොටසක් අයත් වේ.

පොලිස් කන්ද පාර - (වම්පස) වරිපනම් අංක 9-29/1
පොලිස් කන්ද පාර - (දකුණුපස) වරිපනම් අංක 4-42
ගාඩින් සිටි පාර - (වම්පස) වරිපනම් අංක 13-21
ගාඩින් සිටි - (දකුණු පස) වරිපනම් අංක 2.

10-51/1

---

## හපුතලේ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී අංක 03 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2022 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134 වගන්තියේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, එකී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2022 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් ද, ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහට අඩු නමුත් හෙක්ටයාර එකකට නොඅඩු වන අවස්ථාවක රුපියල් 50 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට ; හා

(ආ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික 4කින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-51/2

---

## හපුතලේ ප්‍රාදේශීය සභාව

### 2022 සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුලත 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර හපුතලේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් හපුතලේ ප්‍රදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| | I වන තීරුව<br>*බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | II වන තීරුව<br>*ගෙවිය යුතු බද්ද රුපියල්*<br>*රු. ශ.* |
|---|---|---|
| i. | රුපියල් 6,000.00 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| ii. | රුපියල් 6,000.00 ඉක්මවන එහෙත් රුපියල් 12,000.00 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| iii. | රුපියල් 12,000.00 ඉක්මවන එහෙත් රුපියල් 18,750.00 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| iv. | රුපියල් 18,750.00 ඉක්මවන එහෙත් රුපියල් 75,000.00 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| v. | රුපියල් 75,000.00 ඉක්මවන එහෙත් රුපියල් 1,50,000.00 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| vi. | රුපියල් 1,50,000.00 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

*ව්‍යාපාර බදු අදාළ වන ව්‍යාපාර ස්ථානයන්,*

01. බටහිර ඖෂධ වර්ග විකිණීම
02. ආයුර්වේද ඖෂධ වර්ග විකිණීම
03. ආයුර්වේද ප්‍රතිකාර කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
04. විදුලි උපකරණ අලෙවිය
05. ඡායා පිටපත්, රෝණියෝ යන්ත්‍ර භාවිතා කිරීම හා මුද්‍රණ කටයුතු
06. ගීත පටිගත කිරීම
07. වීඩියෝ පට, කැසට් අලෙවිය
08. මල් පැල වර්ග අලෙවිය
09. විශේෂ වෛද්‍ය උපදේශන සේවා ස්ථාන
10. පෞද්ගලික සායන හා සාත්තු නිවාස
11. ටයර් විකිණීම
12. රබර් මුද්‍රා කිරීම
13. ගෑස් සිලින්ඩර් ගබඩාව හා අලෙවිය
14. මෝටර් රථ, පාපැදි, යතුරු පැදි, ත්‍රී රෝද රථ අමතර කොටස් අලෙවිය
15. රෙදිපිළි වෙළඳාම
16. දුරකථන කුළුණු පවත්වාගෙන යන්නන්
17. පෞද්ගලික පන්ති පවත්වාගෙන යන අධ්‍යාපන ආයතන
18. මූල්‍ය ආයතන කටයුතු
19. කොන්ත්‍රාත්කරුවන්
20. වෙන්දේසිකරුවන්
21. මෝටර් රථ වාහන වෙළඳාම් කරන්නන්
22. රියදුරු පුහුණු පාසල්
23. ලොතරැයි අලෙවි නියෝජිත
24. යතුරු ලියන අයතන පවත්වාගෙන යාම
25. ඒජන්සි පවත්වාගෙන යාම
26. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම
27. කළුගල් ගබඩාවක් පවත්වාගෙන යාම
28. හාඩ්වෙයාර්
29. පොත්පත් හා ලිපිද්‍රව්‍ය
30. සුරාසැලක් පවත්වාගෙන යාම
31. ප්ලාස්ටික් නිෂ්පාදන අලෙවිය
32. දැව විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33. ටෙලෙක්ස්, දුරකථන පණිවිඩ සේවාවන් සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
34. ගෘහ භාණ්ඩ විකිණීම
35. උත්සව භාණ්ඩ කුලියට දීම
36. පෞද්ගලික ආරක්ෂක සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
37. උපස්ථායක සේවා සපයන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
38. සෙලියුලර් දුරකථන අළුත්වැඩියා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. ඉහතින් පෙන්වා නොමැති ව්‍යාපාර යටතට ගැනිය හැකි වෙනත් ව්‍යාපාර.

10-51/3

## හපුතලේ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද එම වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ ඒ එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2022 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර ගෙවිය යුතු බවටත් හපුතලේ ප්‍රදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *I වන තීරුව* *කර්මාන්තයේ ස්වභාවය* | *II වන තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම* *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක* |
|---|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | බීම පැකට් නිෂ්පාදනය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | අත්‍යන්ත්‍ර මගින් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ඉදල්, කොසු නිෂ්පාදනය අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | මැටි භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | ඔරලෝසු අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ශබ්දවාහිනී යන්ත්‍ර කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම මැෂින් 01 ක් සඳහා මැෂින් 02 සිට 05 දක්වා | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පිඟන් භාණ්ඩ, ඇළුමිනියම් භාණ්ඩ, ප්ලාස්ටික් භාණ්ඩ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | පාවහන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | මිනී පෙට්ටි නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I වන තීරුව කර්මාන්තයේ ස්වභාවය | II වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත |
|---|---|---|---|---|
| 14. | කම්මලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | මෝටර් රථ වාහනවල විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | භාණ්ඩ හෝ ද්‍රව්‍ය ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | පා පැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | සෙලියුලර් දුරකතන අළුත්වැඩියා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | වීඩියෝ කැසට් පට අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | පිංතූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | වානේ ගෘහ භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | පරිඝනක අළුත්වැඩියාකිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | රතුන් බඩු ඔප දැමීම හා අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | රෙදි හා රෙදිපිළි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | විසිතුරු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | මේ යටතේ සඳහන් නොවන අතුරු ව්‍යවස්ථාව යටතේ කර්මාන්ත | 500 0 | 750 0 | 1,000 0 |

10-51/4

---

## හපුතලේ ප්‍රාදේශීය සභාව

### හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2022 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 06 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2022 වර්ෂයේ දී හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**යෝජනාව**

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූපිත සටහනේ මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක ඉහත දෙවන කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන්පළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පොලෙහි 2021 වර්ෂය තුළ ලැබීම්වලින් 0.75% විය යුතු බවට හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | බේකරි කෑම ජංගම අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | තේ හෝ කෝපි කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | ආපනශාලා/බත්කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | ලැගුම්හල්/නවාතැන්පල (සාමාන්‍ය) | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | බාබර් සාප්පුවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | මාළු විකිණීම (මුහුදු/මිරිදිය) | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | එළවළු හා පලතුරු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ශීතකළ මාළු හෝ මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | ලොන්ඩරි | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ආහාර සැපයීම කේටරින් සර්විස් | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ආහාර පාර්සල් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සත්ත්ව පාලන (මස්, කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | සිල්ලර වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | සබන් දියර නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ලෝහ සුන්බුන් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | ගෘහ භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | සිරප් හෝ පළතුරු බීම නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | රස කැවිලි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | දැව ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |

| I වැනි තීරුව | | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| අනු. අංකය | වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 23. | කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ටයර්, ටියුබ් වොල්කනයිස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | සිමෙන්ති, භාණ්ඩ හෝ ඇස්බැස්ටස් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | යන්ත්‍රාණුසාරයෙන් බ්ලොක්ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | බේල් රෙදි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | කුකුළු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ටයර්/බෑග් සම්භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | සපත්තු/බෑග් සම්භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | කළුගල් තැනීම හෝ කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | සිසිල් බීම නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | පාවිච්චි කළ ඇඳුම් ගබඩාව | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | පා පැදි හෝ යතුරු පැදි අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ලෝහ කර්මාන්ත (ආයුධ, යන්ත්‍රෝපකරණ, උපකරණ නිපදවීම) | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | වැල්ඩින් වැඩපලක් පවත්වාගන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | ලෝහ වර්ග පෑස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | මෝටර් වාහන අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | මෝටර් වාහන සේවා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | මෝටර් වාහන බොඩි තැබීම | | | |
| 46. | වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | ඉලෙක්ට්‍රොනික උපකරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | වී මෝල් | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | දුරකතන අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | විද්‍යුත් උපකරණ අළුත්වැඩියා හෝ එකලස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | යෝගට් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | හඳුන්කූරු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | තේ කුඩු පැකට් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | කොන්ක්‍රීට් වැඩපළක් හා සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදන වැඩපොළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදන වැඩපොළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I වැනි තීරුව<br>වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය | II වැනි තීරුව<br>ස්ථානයේ වාර්ෂික වටිනාකම<br>රු. 750 නොඉක්මවන අවස්ථාවක | <br><br>රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | <br><br>රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 59. | විකිණීම සඳහා සුරතල් මසුන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | බිම් මල් වගා කිරීම හා ඇසුරුම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | රසායනාගාර පහසුකම් සපයන් ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | රූපවාහිනි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | පාපැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | ඉහතින් සඳහන් නොවන වෙනත් බලපත්‍ර ලබාගත යුතු යැයි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වන වෙළෙඳ ව්‍යාපාර | | | |

10-51/5

---

**හපුතලේ ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත ගාස්තු අය කිරීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වන වගන්තියේ (1) වන උප වගන්තියේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක්, වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක (1%) බද්දක් එකී වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් හපුතලේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-51/6

## හපුතලේ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද මාර්තු 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වන උපවගන්තියෙන් හපුතලේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හපුතලේ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

*(අ)* ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැතිනම් හෝ,
*(ආ)* ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ,
*(ඇ)* ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1/10ට අඩු වන්නේ නම්,

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2022 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක බද්දක් ඉඩම් අයිතිකරුගෙන් පනවා අය කිරීමට හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-51/7

---

## හපුතලේ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 09 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද එම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගාස්තුව එකී ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට දින 03 කට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත්, එසේ නොකරන්නේ නම් ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම ඉවත් කිරීමට සිදු වන බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126(ii) උපවගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව 2 හා 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 17 වන කොටසේ විධිවිධාන ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, මාර්ගයකට, ඇළකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක්, 2022 වර්ෂය සඳහා පනවා අය කර ගැනීමට හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

| *අනු. අංකය* | *දැන්වීම් පුවරුවේ ස්වභාවය* | *ගාස්තුව රුපියල් (වර්ග අඩියකට)* | | |
|---|---|---|---|---|
| | | *මාස 03 කට අඩු* | *මාස 03 හෝ මාස 06ත් අතර* | *වසරක්* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 40 0 | 60 0 | 100 0 |
| 02. | රෙදි, ඩිජිටල් බැනර් සඳහා | 30 0 | 50 0 | 80 0 |
| 03. | තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 30 0 | 50 0 | 80 0 |
| 04. | විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 60 0 | 80 0 | 120 0 |
| 05. | ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 80 0 | - | - |
| 06. | ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 75 0 | 100 0 | 125 0 |
| 07. | විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | - | - | 200 0 |

10-51/8

---

**හපුතලේ ප්‍රාදේශීය සභාව**

2022 රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී යෝජනා අංක 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තම සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු ගෙවීම එහි II තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2022 වර්ෂයට අයකළ යුතු බවටත් එකී වාහන හා සත්ත්ව බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින්ම එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2022 වර්ෂය සඳහා වූ මෙම බද්ද හපුතලේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව*<br>*රු. ශත* |
|---|---|
| 1. මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| 2. සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්, | 18 0 |
| (ආ) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| 3. සෑම කරත්තයක් සඳහා | 20 0 |
| 4. සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| 5. සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| 6. සෑම අශ්වයෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| 7. සෑම ඇතෙකු සඳහා | 50 0 |

2. සෑම විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

10-51/9

---

**හපුතලේ ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා

සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා 2022 වර්ෂයට අදාළව හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සඳහා එකී උපලේඛනයේ (ii) තීරුවේ අනුප්‍රමාණික ගාස්තුවක් අය කිරීම නියම කළ යුතු බවට හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *අනු අංකය* | | *විස්තරය*<br>*i තීරුව* | *ii තීරුව*<br>*රු. ශත* |
|---|---|---|---|
| 01 | | **ප්‍රධාන ක්‍රීඩාංගණය වෙන් කිරීම** | |
| | i. | වාණිජ කටයුතු සඳහා දිනකට | 5,000 0 |
| | ii. | පොදු කටයුතු | 1,000 0 |
| | iii. | පාසල් හෝ ළදරු පාසල් හෝ පුණ්‍ය කටයුතු සඳහා ගාස්තුවෙන් නිදහස් කිරීම | - |
| | | **සභාව සතු වෙනත් ක්‍රීඩාංගණ වෙන් කිරීම** | |
| | iv. | වාණිජ කටයුතු සඳහා දිනකට | 1,250 0 |
| | v. | පොදු කටයුතු | 500 0 |
| | vi. | පාසල් හෝ ළදරු පාසල් හෝ පුණ්‍ය කටයුතු සඳහා ගාස්තුවෙන් නිදහස් කිරීම | - |
| 02. | | ජල බවුසරය | |
| | i. | ජල බවුසරය නගර සීමාව තුළ ජලය රහිතව (දිනකට) | 3,000 0 |
| | ii. | ජල බවුසරය නගර සීමාවෙන් පිටත | 4,000 0 |
| | iii. | නාගරික බල ප්‍රදේශයට අයත් නොවේ නම් දුර ප්‍රමාණය අනුව එක් කිලෝමීටරයක් සඳහා | 100 0 |
| 03. | | ගලි බවුසරය | |
| | i. | ගලි බවුසරය එක් වාරයකට ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ (නිවාස, ආගමික ස්ථානයක්, රාජ්‍ය ආයතනයක් සඳහා) | 4,050 0 |
| | ii. | අමතර ගමන් වාරයක් සඳහා | 1,500 0 |
| | iii. | ව්‍යාපාරික ස්ථාන සඳහා | 5,050 0 |
| | iv. | අමතර ගමන් වාරයක් සඳහා ව්‍යාපාරික ස්ථාන සඳහා | 2,000 0 |
| | v. | ගලිබවුසරය එක් වාරයකට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් බැහැර නිවාස සඳහා | 9,550 0 |
| | vi. | ගලිබවුසරය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් බැහැර අමතර ගමන් වාරයක් සඳහා (නිවාසයක් සඳහා) | 4,000 0 |
| | vii. | ගලිබවුසරය එක් වාරයකට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් බැහැර ගමන් වාරයක් සඳහා (ව්‍යාපාරික ස්ථාන සඳහා) | 13,050 0 |
| | viii. | ව්‍යාපාරික ස්ථාන අමතර ගමන් වාරයකට | 5,000 0 |
| | ix. | මළ අපද්‍රව්‍ය සභාවේ පූතික ටැංකි තුළ තැන්පත් කරන්නේ නම් | 2,000 0 |
| | x. | නගර සීමා ප්‍රදේශයට අයත් නොවේ නම් එක් කිලෝමීටරයක් සඳහා | 150 0 |
| 04. | | බැකෝ යන්ත්‍රය | |
| | i. | පෞද්ගලික කටයුතු සඳහා එක් යන්ත්‍ර පැයකට | 2,500 0 |
| | ii. | සුභ සාධක කටයුතු සඳහා එක් යන්ත්‍ර පැයකට | 2,000 0 |

| *අනු අංකය* | | *විස්තරය* *i තීරුව* | *ii තීරුව* *රු. ශත* |
|---|---|---|---|
| 05. | | **ට්‍රේලරය සමග ට්‍රැක්ටරය කුළියට දීම** | |
| | i. | දිනකට ඉන්ධන රහිතව | 4,000 0 |
| 06. | | **පුස්තකාල සේවා** | |
| | | **සාමාජික අයදුම්පත්‍රයක් සඳහා** | 20 0 |
| | i. | පුස්තකාල සාමාජික ගාස්තු (වැඩිහිටි) | 100 0 |
| | ii. | පුස්තකාල සාමාජික ගාස්තු (ළමා) | 50 0 |
| | iii. | පුස්තකාල ප්‍රමාද ගාස්තු දිනකට එක් පොතක් සඳහා | 5 0 |
| 07. | | **අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සේවා ගාස්තු** | |
| | i. | ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ස්ථාන වෙන් කිරීමේ ගාස්තු පැය 12 ක | 4,000 0 |
| | ii. | ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ස්ථාන වෙන්කිරීමේ ගාස්තු පැය 6 කට | 2,000 0 |
| | iii. | කුඩ ආවරණයක් සඳහා දිනකට | 500 0 |
| 08. | | **සුසාන භූමි** | |
| | i. | මෘත දේහ භූමදානය කිරීම සඳහා ඕනෑම වයස් බාණ්ඩයකට නිදහස්ය | - |
| | ii. | තැන්පත් කිරීම | 25,000 0 |
| | | වාර්ෂිකව පවත්වාගෙන යාම සඳහා | 5,000 0 |
| | iii. | ස්මාරක ඉදිකිරීමට | 10,000 0 |
| 09. | | **තාවකාලික බලපත්‍රයක් මත යම් විශේෂ උත්සව අවස්ථාවකට අදාළව,** | |
| | | **(අදාළ ඉල්ලුම්පත්‍රය රු. 5.00ක මුද්දරයක් සහිත ඉදිරිපත් කළ යුතුය)** | |
| | | ගවයෙකු ඝාතනය සඳහා අයකරනු ලබන ගාස්තු | 1,000 0 |
| | | එළුවෙකු ඝාතනය සඳහා අයකරනු ලබන ගාස්තු | 1,000 0 |
| 10. | | **වෙනත් ගාස්තු** | |
| | i. | කැනපි හට් එකක් සඳහා | 500 0 |
| | ii. | GI බටයක් සඳහා | 10 0 |
| | iii. | ප්ලාස්ටික් පුටු එකක් සඳහා | 10 0 |
| | iv. | කොඩි කණුවක් සඳහා | 25 0 |
| | v. | කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 100ට වැඩියෙන් තොග වශයෙන් ලබාගන්නේ නම් | 10 0 |
| | vi. | කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 100ට අඩුවෙන් ලබාගන්නේ නම් | 11 0 |
| | viii. | සංචාරක වෙළෙඳාම (වාහන මගින්) | 1,000 0 |
| | viii. | තාවකාලික වෙළෙඳ කුටි සඳහා වාර්ෂිකව | 1,000 0 |
| | ix. | පාපැදි බලපත්‍ර සඳහා අයකරනු ලබන ගාස්තු | 15 0 |
| | x. | පාපැදි අයදුම්පත්‍ර ගාස්තුව | 10 0 |
| 11. | i. | විථි රේඛා ගාස්තු | 1,000 0 |
| | ii. | ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු | 300 0 |
| | iii. | වරිපනම්/අක්කර බදු/උධෘත සහ සහතික | 500 0 |
| | iv. | වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ ගාස්තු (සභා තීරණය මත) | 200 0 |
| | v. | පිඹුරුපත් අනුමත කිරීම/ අනු බෙදුම් සඳහා අවසර දීම එක් කට්ටලයක් සඳහා | 500 0 |
| | vi. | ගොඩනැගිලි සැලසුම් සඳහා පෙරසැරි ගාස්තු (නාගරික සීමාවෙන් බාහිර ප්‍රදේශ සඳහා වර්ග අඩියකට) | 500 0 |
| | | නේවාසික ස්ථාන (නව ඉදිකිරීම්) | 2 0 |

| *අනු අංකය* | *විස්තරය* *i තීරුව* | *ii තීරුව* *රු. ශත* |
|---|---|---|
| | ව්‍යාපාර ස්ථාන (නව ඉදිකිරීම්) | 5 0 |
| | අතිරේක ගාස්තු (දැනටමත් ඉදිකර ඇති ඉදිකිරීම්) | 3 0 |
| vii. | අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා | 1,000 0 |
| viii. | නිර්වන්දි ගිවිසුම | 1,000 0 |
| ix. | ගොඩනැගිලි සැලසුම් සහතික කළ පිටපත් | 300 0 |
| x. | ඉඩම් අනුබෙදුම් පර්. එකක් සඳහා | 300 0 |
| xi. | මායිම් තාප්ප (පැති බැම්) අඩි 01 ක් සඳහා | 35 0 |
| xii. | වෙළෙඳ බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු | 50 0 |

10-51/10

---

**හපුතලේ ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 12 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**යෝජනාව**

1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් අංක 1535/16 සහ 2008 ජනවාරි මස 25 දිනැති 1534/18 දරන 2008.02.01 දිනැති සංශෝධිතව පනවන ලද රෙගුලාසිවලට අනුව පහත උපලේඛන අංක II හි සඳහන් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් උපලේඛන අංක I හි අනුප්‍රමාණික බලපත්‍ර ගාස්තු ගෙවා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු බව හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛන I**

| *ආයෝජනය* | *පරීක්ෂණ කිරීමේ ගාස්තුව (උපරිම)* *රු. ශත* |
|---|---|
| රු. 2,50,000.00 හෝ ඊට අඩු | 3,000 0 |
| රු. 2,50,001.00 - 5,00,000.00 දක්වා | 3,750 0 |
| රු. 5,00,001.00 - 10,00,000.00 | 5,000 0 |
| රු. 10,00,000ට වැඩි | 10,000 0 |
| වර්ෂ 3 කින් නිකුත් කරනු ලබන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව | 4,000 0 |

### උපලේඛනය II

01. සියලුම වාහන ඉන්ධන පිරවුම් හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු)
02. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදිත කර්මාන්ත
03. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිඳීමේ කර්මාන්ත
04. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
05. වියලි ක්‍රියාවලි සහිත වී මෝල්
06. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 1000 කට අඩුවන ඇඹරුම්හල්
07. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
08. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
09. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
10. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
11. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවක සංඛ්‍යාව 20 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
12. උළු සහ ගඩොල් කර්මාන්ත
13. එක් වරකට එක් බෝරවලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 60 ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරනු ලබන කර්මාන්ත
14. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5 ට වැඩි 25ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
15. නේවාසික කාමර 05 හෝ ඊට වැඩි සහ 20 ට අඩු හෝටල් ආගන්තුක නිවාස සහ තානායම්
16. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ/ නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ
17. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම/ නඩත්තු කිරීම හා සවි කිරීම සිදු කරනු ලබන ස්ථාන
18. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන
19. ඊයම් උණු කිරීම සිදුකිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
20. මෙයට අමතරව පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු යැයි තීරණය කරනු ලබන වෙනත් ව්‍යාපාර

10-51/11

---

## හපුතලේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා රථ වාහන නවතා තැබීමේ ගාස්තු පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 13 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,<br>
සභාපති,<br>
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,<br>
හපුතලේ ප්‍රාදේශීය සභාව,<br>
දියතලාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22, 122, 126 වගන්ති යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, හා හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2002.08.02 දිනැති අංක 1248 දරන *ගැසට්* නිවේදනය මගින් පනවා ගන්නා ලද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකළ යුතු බවට හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| *වාහන නැවතුම් ගාස්තු :-* | | |
| *(අ)* | ත්‍රී රෝද රථයක් සඳහා පැයකට | 50 0 |
| | (පැයකට වඩා වැඩි වූ විට) | 100 0 |
| *(ආ)* | මෝටර් රථයක්, වෑන් රථයක් සඳහා පැයකට | 100 0 |
| | (පැයකට වඩා වැඩි වූ විට) | 200 0 |
| *(ඇ)* | බස් රථයක්, මෝටර් කෝච් රථයක්, ලොරියක් හෝ ට්‍රැක්ටරයක් සඳහා පැය 02කට | 100 0 |
| | (පැය දෙකකට වඩා වැඩි වූ විට පැයකට) | 100 0 |
| *පොදු නවතා තැබීමේ ස්ථාන භාවිතා කිරීම සඳහා මාසික ගාස්තුව :-* | | |
| *(අ)* | ත්‍රීවිල් රථ සඳහා (නගර සීමා) | 250 0 |
| *(ආ)* | වෑන්, ලොරි රථ සඳහා(නගර සීමා) | 250 0 |
| (ඇ) | ත්‍රීවීල් රථ සඳහා (නගර සීමාවෙන් පිටත) | 150 0 |

10-51/12

---

## හපුතලේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් සහ සතුන් පිළිබඳ ගාස්තු පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 14 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66-(1) (2) හා (3) උපවගන්තියෙහි විධි විධාන ප්‍රකාරව, හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් මංමාවතක හෝ ඒ අවට දිගේලිකර හෝ අයාලේ යන ගවයින්, මී ගවයින්, එළුවන් ආදි සතුන්ගෙන් ප්‍රදේශයේ ජනතාවට සහ දේපළවලට විශාල වශයෙන් හානි පැමිණෙන බැවින් එම ආපදාවන් වැළැක්වීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66-(1) (2) හා (3) උපවගන්තියෙහි විධිවිධාන පරිදි ක්‍රියා කිරීමේ දී අල්ලා ගනු ලබන සතුන් සඳහා හා එකී සතුන්, නිදහස් කර ගැනීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකළ යුතු බවට හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| | | රු. ශත |
|---|---|---|
| 01. | ගවයෙකු, මී ගවයෙකු, එළුවකු හෝ ඌරෙකු ඇල්ලීමේ ගාස්තුව | 1,000 0 |
| 02. | එම සතුන් නඩත්තු කිරීමේ ගාස්තු | 500 0 |

10-51/13

## හපුතලේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 15 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 22, 122(1), 126 වන වගන්ති මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අංක 1816/43 හා 2013.06.28 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව 13 වැනි කොටස මගින් හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම, පාලනය කිරීම හා ඒ සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් පවරා ඇති බලතල ප්‍රකාරව, හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත උපලේඛනයේ I කොටසින් නිරූපිත පරිශ්‍රයන් හෝ එකී උපලේඛනයේ II වන කොටසක් අනුප්‍රමාණික ගාස්තුවක් කසළ ගාස්තු ලෙස පනවා අය කළ යුතු බව හපුතලේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

### උපලේඛනය

*එකතු කරනු ලබන කසළ ගාස්තු ප්‍රමාණය :-*

| *ආයතනය මගින් දිනකට පළාත් පාලන ආයතනය වෙත ලබා දෙනු ලබන කසළ ප්‍රමාණය* | *මසකට අයකරනු ලබන ගාස්තු ප්‍රමාණය (රුපියල්)* |
|---|---|
| කිලෝ 0 ත් - කිලෝ 5 ත් අතර | ගාස්තු අය නොකළ යුතු ය |
| කිලෝ 5 ත් - කිලෝ 10 ත් අතර | 150 0 |
| කිලෝ 10 ත් - කිලෝ 20 ත් අතර | 400 0 |
| කිලෝ 20 ත් - කිලෝ 30 ත් අතර | 600 0 |
| කිලෝ 30 ත් - කිලෝ 50 ත් අතර | 1,000 0 |
| කිලෝ 50 ත් - කිලෝ 100 ත් අතර | 2,000 0 |
| කිලෝ 100 ත් - කිලෝ 150 ත් අතර | 3,000 0 |
| කිලෝ 150 ත් - කිලෝ 200 ත් අතර | 4,000 0 |
| කිලෝ 200 ත් - කිලෝ 300 ත් අතර | 6,000 0 |
| කිලෝ 300 ට වැඩි | 7,500 0 |

10-51/14

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.